## 12. ශීර්ෂය 12 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

### 12.1 විගණන විෂය පථය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 මැයි 07 දින කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 12.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 12.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 12.4

සිට 12.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සෙයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---------------------------------------------

කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසි |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 නොවැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගණක උපාංග හා මෘදුකාංග ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**(ආ) අයවැය විචලනය**

-------------------

(i) එක් වැය ශීර්ෂයක් සඳහා සලසා තිබුණු රු.50,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි .

(ii) වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් රු.14,115,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.3,953,852 ක් හෙවත් සියයට 28 ක් ඉතිරි වී තිබුණි. වැය විෂයයන් අතර එම පරාසය සියයට 27 ත් සියයට 82 ත් අතර ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(ඇ) **අයවැය සහය සේවා හදිසි අවශ්‍යතා වගකීම් යටතේ ලබාගත් ප්‍රතිපාදන**

-----------------------------------------------------------------------

පුනරාවර්තන වැය විෂය 09 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5 ට වැඩි රු.4,003,852 ක් වූ වියදම් නොවූ ප්‍රතිපාදනයක් තිබියදී 2011 වර්ෂයේ අධ්‍යයන වාර්තාවක භාෂා පරිවර්තන කටයුතු සඳහා රු.281,000 ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයක් ලබාගෙන තිබුණි.

**12.4 යහපාලනය සහ ගිණුම්කටයුතුභාවය**

------------------------------------

**12.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තා**

------------------------------

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක PF/R/2/2/3/5/(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාර කොමිෂන් සභාව විසින් පිළියෙල කළයුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව 2013 ජූනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**12.5 කාර්යසාධනය**

---------------

ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කාර්යයන් කිසිවක් ඉටුකර ගැනීමට කොමිෂන් සභාවට නොහැකි වී තිබුණ අතර දැනුමැති සමාජයක් සඳහා අධ්‍යාපන ව්‍යාපෘතියෙන් අනුමත කර තිබූ රු.7,306,940 ක් වූ ආධාර මුදල් නොලැබීමත්, කොමිෂන් සභාව පත් කිරීමට ප්‍රමාද වීමත් ඊට හේතු වී තිබුණි.

**12.6 කළමණාකරණ දුර්වලතා**

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) පුස්තකාල පොත් තොග සම්බන්ධ සමීක්ෂණයක් ආයතනය ආරම්භයේ සිටම සිදුකර නොතිබුණි.

(ආ) රු.938,600 ක වියදමකින් ස්ථාපිත කරන ලද දත්ත බැංකුවේ කටයුතු සඳහා සුදුසු නිලධාරීන් අනුයුක්ත කර නොතිබුණි.

(ඇ) කොමිෂන් සභාව විසින් මුද්‍රණය කරනු ලබන පොත් සම්බන්ධයෙන් පිරිවැය ගණනය කිරීම හා තොග පාලන පටිපාටීන් අනුගමනය කර නොතිබූ අතර අවශ්‍යතාවය නොසලකා මුද්‍රණය කිරීම හේතුවෙන් 2003-2009 අතර කාලය තුළ මුද්‍රිත පොත් 4,382 ක් කොමිෂන් සභාවෙන් ශේෂ වී තිබුණි.

## 12.7 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 02 | 01 |
| (ආ) | තෘතියික මට්ටම | 12 | 07 | 05 |
| (ඇ) | ද්විතීක මට්ටම | 10 | 05 | 05 |
| (ඉ) | ප්‍රාථමික මට්ටම | 12 | 12 | - |
| | එකතුව | 37 | 26 | 11 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 11 ක් පිරවීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

### (ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්

කොමිෂන් සභාවේ ආරක්ෂක නිලධාරියෙකු 2005 සැප්තැම්බර් සිට 2012 දෙසැම්බර් දක්වාම විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයටත්, අනතුරුව ක්‍රීඩා අමාත්‍යාංශයටත් මුදා හැර එම කාලය තුළ වැටුප් හා දීමනා ලෙස රු.1,833,705 ක් ගෙවා තිබූ අතර එම මුදා හැරීම

හේතුවෙන් පෞද්ගලික ආරක්ෂක සේවා ආයතනයකින් සේවා ලබා ගැනීමට සිදුවීම නිසා සමාලෝචිත වර්ෂයේ දී පමණක් රු.547,500 ක් ගෙවීමට සිදු වී තිබුණි.

**12.8 අභ්‍යන්තර පාලනය**

**(අ) අභ්‍යන්තර විගණනය**

ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ආ) කළමනාකරණ හා විගණන කමිටුව ක්‍රියාත්මක කිරීම**

2009 සැප්තැම්බර් 30 දින සිට 2012 දෙසැම්බර් 31 දින දක්වාම විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මකවී නොතිබුණි.